# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2012/19 - 2017 මාර්තු මස 29 වැනි බදාදා - 2017.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 5/3/4/3/4-1.
*ඉඩම් අමාත්‍යාංශයේ ලි. ගො. අංකය* : LD/05/2009/UDA/227.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමේ කාර්යය* : මහ දඹුල්ල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රවේශ මාර්ගයක් ඇතුළු නාගරික සංවර්ධන කටයුතු

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ පරවශතාවයේ විස්තර:*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුල්ල නගර සභා සීමාව තුළ, අංක E 445 දඹුල්ල නගරය ග්‍රාම නිලධාරී වසම තුළ, කොට්ඨාස අංක 02, පාදෙනිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙළ කරන ලද මා 1662 හා 2016.02.12 දිනැති මූලික පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7177කින් යුක්ත කැබලි අංක 1 සිට 16 දක්වා සඳහන් ඉඩම් කැබලි දහසය (16).

01. කැබලි අංක 1

ඉඩමේ නම: කොළොන්ගහමුල යාය; විස්තරය: ගෙවත්ත, අවුරුදු 12 ක් වයසැති කුඹුක් ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0050.

02. කැබලි අංක 2

ඉඩමේ නම: කොළොන්ගහමුල යාය; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10 ක් වයසැති තේක්ක ගසක් අවුරුදු 20 ක් වයසැති සියඹලා ගසක් සහ අවුරුදු 9 ක් වයසැති කොහොඹ ගසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 186, නුවර පාර, දඹුල්ල ලිපිනයෙහි පදිංචි කමනි හේමලතා විතානගේ; ප්‍රමාණය: හෙක්. 0.0727.

03. කැබලි අංක 3

ඉඩමේ නම: කොළොන්ගහමුල යාය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 186, නුවර පාර, දඹුල්ල ලිපිනයෙහි පදිංචි සුමතිපාල විතානගේ; ප්‍රමාණය: හෙක්. 0.0363.

04. කැබලි අංක 4

ඉඩමේ නම: කොළොන්ගහමුල යාය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අංක 6/172, ගලේවෙල ස්ටෝර්ස්, දඹුල්ල ලිපිනයෙහි පදිංචි විජේසූරිය, සරණසූරිය ජයසේකර; ප්‍රමාණය: හෙක්. 0.0601.

05. කැබලි අංක 5

ඉඩමේ නම: මීගහමුල වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-15ක් වයසැති මිශ්‍ර බෝග වගාව; හිමිකම් කියන අය: රජය; මුල්



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

හිමිකම් පාන්නා: අංක 6/172 ගලේවෙල ස්ටෝර්ස්, දඹුල්ල ලිපිනයෙහි පදිංචි සරණසූරිය ජයසේකර; ප්‍රමාණය: හෙක්. 0.1086.

06. **කැබලි අංක 6**
ඉඩමේ නම: මීගහමුල වත්ත; විස්තරය: ගෙවත්ත අවුරුදු 10-15 ක් වයසැති මිශ්‍ර බෝග වගාව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0146.

07. **කැබලි අංක 7**
ඉඩමේ නම: මීගහමුල වත්ත; මුල් හිමිකම් කියන අය: නිශ්ශංක හන්දිය දඹුල්ල ලිපිනයෙහි පදිංචි වඩුතන්ත්‍රිගේ ධනපාල; ප්‍රමාණය: හෙක්. 0.0284.

08. **කැබලි අංක** 8
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-15 ක් වයසැති මිශ්‍ර බෝග වගාව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: පාලම ඇල, පහල වැව දඹුල්ල ලිපිනයෙහි පදිංචි වෙල්ගමගේ වසන්ත වෙල්ගම; ප්‍රමාණය: හෙක්. 0.0088.

09. **කැබලි අංක 9**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-15 ක් වයසැති මිශ්‍ර බෝග වගාවක් සහ ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නා : රජය; මුල් හිමිකම් කියන අය: පාලම ඇල, පහල වැව දඹුල්ල ලිපිනයෙහි පදිංචි හේරත් මුදියන්සේලාගේ රාජරත්න; ප්‍රමාණය: හෙක්. 0.00104.

10. **කැබලි අංක 10**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-12 ක් වයසැති කොහොඹ ගසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: මාතලේ පාර, දඹුල්ල ලිපිනයේ පදිංචි අස්වෙදගෙදර අනුලාවතී; ප්‍රමාණය: හෙක්. 0.1070.

11. **කැබලි අංක 11**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, 10-15ක් වයසැති මිශ්‍ර බෝග වගාව; මුල් හිමිකම් කියන අය: පාලම ඇල, පහල වැව දඹුල්ල ලිපිනයෙහි පදිංචි කරුපන්ගේ ලෙච්චමී; ප්‍රමාණය: හෙක්. 0.0196.

12. **කැබලි අංක 12**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10ක් වයසැති කොස් ගසක්, අවුරුදු 12ක් වයසැති කොහොඹ ගස් 2ක් සහ අවුරුදු 9 ක් වයසැති පොල් ගසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: පාලම ඇල, පහල වැව දඹුල්ල ලිපිනයෙහි පදිංචි කරුපන්ගේ ගනේෂ්වරී; ප්‍රමාණය: හෙක්. 0.0077.

13. **කැබලි අංක 13**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10ක් වයසැති කොස් ගසක්, අවුරුදු 12 ක් වයසැති කොහොඹ ගස් 2 සහ අවුරුදු 9 වයසැති පොල් ගසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: පාලම ඇල, පහල වැව දඹුල්ල ලිපිනයෙහි පදිංචි මැදවත්තේ ගෙදර අතපත්තු, ආරච්චිලාගේ කරුණාරත්න ; ප්‍රමාණය: හෙක්. 0.0168.

14. **කැබලි අංක 14**
ඉඩමේ නම: මීගහමුල අස්සැද්දුම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: අංක 01 පාදෙණිය, දඹුල්ල ලිපිනයෙහි පදිංචි එදිරිසිංහ කොමසාරිස්ලාගේ ජේම්ස් පෙරේරා; ප්‍රමාණය: හෙක්. 0.0758.

15. **කැබලි අංක 15**
ඉඩමේ නම: කොහොඹගහ වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 8 ක් වයසැති කොහොඹ ගස් 27 ක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: අංක 01 පාදෙණිය, දඹුල්ල ලිපිනයෙහි පදිංචි එදිරිසිංහ කොමසාරිස්ලාගේ එදිරිසිංහ; ප්‍රමාණය: හෙක්. 0.1356.

16. **කැබලි අංක 16**
ඉඩමේ නම: කොහොඹගහ වත්ත; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0103.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017.06.21 වැනි දින පෙ.ව.10.00 ට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද 2017.06.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. පී. පී. ඒ. හේවාපතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2017 මාර්තු මස 13 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

04-298

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.